# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : **011-2868441, 2868442, 286844**
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : **011-2868426**

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය **(10107)**
**தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்**
**சரண மாவத்தை, இராஜகிரிய (10107)**

***web : www.slelections.gov.lk*** ***e-mail : info@slelections.gov.lk***


මගේ අංකය : **EC/EDR/2020/4** ඔබේ අංකය : MSTR/2/4/INO - TECH දිනය : **2020.03.08**
எனது இல. உமது இல. திகதி

උපදෙස් ලිපි අංක - **04**

**සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන විධායක නිලධාරීන් වෙත.**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

**මැතිවරණ දිනයට පෙරාතුව විකාශය කරන ලද/ ප්‍රචාරය කරන ලද හෝ**
**පළ කරන ලද දේශපාලනඥයන් සහභාගී වූ වැඩසටහන් නැවත නැවත විකාශය කිරීම/ පලකිරීම**

2020 පාර්ලිමේන්තු මැතිවරණය ප්‍රකාශයට පත්කර ඇති හෙයින් ඡන්ද විමසීම් කාලසීමාව 2020.03.02 සිට ආරම්භව මැතිවරණයේ ප්‍රතිපල නිකුත් කර අවසන් වන තෙක් ක්‍රියාත්මක වේ. මෙම කාල සීමාව තුළ මාධ්‍ය ආයතන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වන මහපෙන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ. (5) (අ), (1) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාවට ලැබී ඇති බලතල අනුව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන සම්බන්ධයෙන් වන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ලබා දේ.

02. මේ වන විට දේශපාලනඥයන් සහභාගී වූ පූර්වයෙන් විකාශනය කරන ලද විවිධ වැඩ සටහන් එනම් දේශපාලන වැඩසටහන්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, විනෝදාත්මක වැඩසටහන්, සංවර්ධන කටයුතු හෝ එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධ වැඩසටහන්, චිත්‍රපට, ටෙලි නාට්‍යය , සංගීත ප්‍රසංග, ගී තේරීම් වැඩසටහන් හෝ එවැනි ස්වභාවයක වෙනත් යම් වැඩසටහන් නැවත නැවත විකාශය කරන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබෙමින් පවතී.

03. මෙම වැඩසටහන් නැවත නැවත විකාශය කිරීම තරග කරනු ලබන යම් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් පමණක් නොව ඇතැම් අපේක්ෂයන්ද අන් අපේක්ෂයන්ට සාපේක්ෂව, විශේෂ ප්‍රවර්ධනයක් සිදුවන බව නිරීක්ෂණය වේ. මැතිවරණයක දී සම භූමියක තරග කිරීම සඳහා සෑම අපේක්ෂකයෙකුටම ඉඩ ප්‍රස්ථා සැලසීමේ අවකාශය මෙවැනි වැඩසටහන් විකාශය කිරීම තුළින් අභියෝගයට පත්වන බැවින්, මැතිවරණ කාලසීමාව අවසන් වන තෙක් පූර්වයෙන් විකාශය කරන ලද, ප්‍රචාරය කරන ලද හෝ පළ කරන ලද දේශපාලනඥයන් සහභාගී වූ වැඩසටහන් නැවත නැවත විකාශය නොකරන ලෙස දැනුම් දෙමි.

04. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා ඔබ ආයතනයේ කාර්යමණ්ඩලයෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කරමි.

**මහින්ද දේශප්‍රිය**
සභාපති/ මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)